**විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**වීඩියෝ කැමරා ශිල්පී තනතුරට තාවකාලික පදනම මත**

**බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම්** :

2.1 **අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06කින් සමත් වී තිබීම.

2.2 **වෘත්තීය සුදුසුකම්** : ඡායාරූපකරණය / වීඩියෝ කැමරාකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

2.3 **පළපුරුද්ද** : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

2.4 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.5 **වෙනත්** :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. වයස** :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.

**04. තනතුරේ කාර්යයන් :**

4.1 වීඩියෝ කිරීම,විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූප ගත කිරීම හා සංස්කරණය.

4.2 සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු.

4.3 වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.

4.4 වීඩියෝ පට ලේඛනයක් පවත්වා ගෙන යාම හා සූචි ගත කිරීම.

4.5 වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම.

4.6 ඇස්තමේන්තු සකස් කිරීම.

4.7 ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ගෙම්ට් ඡායාරූප ගැනීම, ඩිජිටල් ක්‍රමය අනුව රූප රාමු ලබා ගැනීම හා සකස් කිරීම.

4.8 පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

**05. තනතුරේ ස්වභාවය** : මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

**06. මාසික දීමනාව** : මූලික දීමනාව :- රු.17,508/=
ගැලපුම් දීමනාව :- රු.9,831/=
ජීවන වියදම් දීමනාව :- රු.7,800/=
(රා.ප.ච.03/2016 අනුව )

**07. බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණයකින්

**7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100% | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| වෘත්තීය පළපුරුද්ද | 30 | |
| තොරතුරු තාක්ෂණය/ පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 10 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

සටහන :

I. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

7.1.1 **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම්

7.1.2 **ප්‍රායෝගික පරීක්ෂණය**

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. වීඩියෝ කැමරා හා ඊට අදාළ උපකරණ ක්‍රියා කරවීම | 30 | |
| 2. වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම | 20 | |
| 3. රූපවාහිනී දර්ශනවලට අදාළව ස්වාභාවික ආලෝකය උපයෝගී කර ගැනීම | 20 | |
| 4. පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව | 10 | |
| 5. කැසට් පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 10 | |
| 6. රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 10 | |
| **එකතුව** | **100** | |

**08. මෙම තනතුර සඳහා තාවකාලික පදනම මත පත්කිරීම් බලධරයා :**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම්

**සැ.යු.** පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. ඇබෑර්තු පිරවීමට හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**09. අයදුම්කරන ආකාරය :**

**9.1** පහත දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිතා කරමින් සකස් කරගත් අයදුම්පත් **2017 නොවැම්බර් 22 දින හෝ ඊට පෙර** ලැබෙන සේ **"ලේකම්, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය, අංක 437, ගාලු පාර, කොළඹ 03."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය.

**9.2** අයදුම්පත අයදුම්කරුගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන / නිවැරදිව සම්පූර්ණ කර නොමැති/ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී සිදුවන ප්‍රමාද දෝෂයට වග කියනු නොලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**9.3** සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලේඛණවල මුල් සහතික ඉදිරිපත් කළ යුතු වේ.

I. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය

II. පොලිස් වාර්තාව

III. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් පදිංචි වසමේ ග්‍රාම නිලධාරීගෙන්)

**9.4** අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය.සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇයගේ සේවය අවසන් කිරීමට පිළිවන.

**9.5** තනතුරට ලබා ඇති පළපුරුද්ද, වෘත්තීය සුදුසුකම්, අධ්‍යාපන සුදුසුකම් සහ ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

**10.** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් අමාත්‍යාංශ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**11.** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**12.** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

වසන්ත දේශප්‍රිය
ලේකම්
විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල
පහසුකම් අමාත්‍යාංශය
අංක. 437, ගාලු පාර, කොළඹ 03.

**වසන්ත දේශප්‍රිය**
ලේකම්
විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය
2017 නොවැම්බර් මස ..04.. දින